# හිනා මනා

පොලිස් කොස්තාපල් වරයෙක් කෙරෙහි කෝපවූ එක්තරා මගියෙකු ඔහුට බූරුවා යැයි බැණ වැදිණ. මින් ලැජ්ජාවටත් කෝපයටත් පත් පොලිස් කොස්තාපල් මගියා අල්ලාගෙන පොලිස් පරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කළේය.

පො.ප: තමා මේ රාළහාමිට බූරුවා කියා බැණ වැදුණාද?
මගියා: එහෙමයි
පො.ප: තමා බරපතල වරදක්කරල තියෙන්නෙ මං පළමුවතාවට සමාව දෙනවා. දැන් වුන
වරදට රාළහාමිගෙන් සමාව ගන්නව.
මගියා: එතකොට ඉන්ස්පැක්ටර් මහත්තය, බූරුවෙකුට රාළහාමි කියල කතා කළොත් ඒකෙ වරදක් තියෙනවද?
පො.ප: බූරුවෙකුට රාළහාමි කිව්වම අපට මොකද ඒකෙ වැරැද්දක් නෑ.

එවිට රාළහාමී දෙසට හැරුණු මගියා''මට සමාවෙන්න රාළහාමි''රාළහාමි මං ගිහින් එන්නං කියා යන්නට ගියේය.

---

බස් රථයකදී කාන්තාවකට කම්මුල් පහරක් ගැසූ පුද්ගලයෙකු එම කාන්තාවත් සමඟ පොලිස් පරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කළේය.

පො.ප: තමා මේ කාන්තාවට බස් රථය තුළදී කම්මුල් පහරක් ගැසුවාද?
මගියා: එහෙමයි.
පො.ප: මොකද එහෙම පහර දෙන්නට හේතුව?
මගියා: මේ කාන්තාව මගේ ආසනයේ අනෙක් පැත්තේ වාඩි වෙලා හිටිය. ඒ හරිය කොන්දොස්තර එන කොට මෙයා එයාගෙ බෑග් එක ඇරියා, පර්ස් එක ගත්තා, බෑග් එක වැහුවා. පර්ස් එක ඇරියා, රුපියල් පහන ගත්තා, පර්ස් එක වැහුවා බෑග් එක ඇරියා, පර්ස් එක දැම්මා, බෑග් එක වැහුවා. එතකොට කොන්දොස්තර
අපි ගාව නවතින්නෙ නැතිව දිගටම ගියා.මෙයා බෑග් එක ඇරියා, පර්ස් එක ගත්තා බෑග් එක වැහුවා, පර්ස් එක ඇරියා, රුපියල් පනහ දැම්මා, පර්ස් එක වැහුවා, පර්ස් එක දැම්මා බෑග් එක....
පො.ප: ඇති ඇති ඇති ඕයි මට පිස්සු හැදී ගෙන එනවා...
මගියා: අනේ ඉන්පෙක්ටර් මහත්තය මටත් ඒ වෙලාවෙ ඒකමයි උනේ.

**ඔබගේ කෙටි රස කතාව අප වෙත එවන්න. මේ තීරයේ එය පළ කරන්නට අප සූදානම්.**

**විද්‍යුත් ලිපිනය:** chithran@sannasa.com.au

Cartoon By Shanika Somatilake




